


**Children's Corner**

## සැඳෑ අසිරිය!

හිරු කුමරිය අහස් ගැබෙන්
සමුගෙන යනවා
සඳ කුමරිය හිනැහි හිනැහි
අහසෙ දිලෙනවා
කුරුලු රැන් කැදළි කරා
පියඹා යනවා
බලන් ඉන්න අපට හරිම
ආස හිතෙනවා

හෙන්දිරික්කා මල් පිපිලා
සුවඳ හමනවා
පුංචි ළමයිගේ සෙල්ලම
අවසන් වෙනවා
රැකියාවට පිටත් වූ සැම
නිවසට එනවා
සැන්දෑ අසිරිය තව තව
සුන්දර වෙනවා

♦ *ඉරෝෂා හෙට්ටිගොඩ*
*බටේමුල්ල ජාතික පාසැල*
*ඉමදුව* Sri Lanka

## දැයේ විරුවෝ

රට ජාතිය සුරකින හෙළ විරුවෝ
සිහල බලය වැඩුමට වෙර දැරුවෝ
බිය සැක නොදුටුව ලක් විරු දරුවෝ
දිවි නොතකා සටනට මුල පිරුවෝ

සයුර ගුවන ගොඩබිම ජය ගත්තු
ජය පැරදුම හොඳහැටි පිළි ගත්තු
සටනේදි නොබියව පෙරමුණ ගත්තු
රට සුරකින රණවිරු දූ පුත්තු

♦ *කේ. ඩබ්. තුසිත ඉසංක*
*ශ්‍රී දේවානන්ද මහ විදුහල*
*අම්බලන්ගොඩ* Sri Lanka

## අ පේ තා ත් තා

මාසයකට එක සැරයක්
ටොපි චොකලට් ජෑම් අරන්
ප්‍රීමා පානුත් අරගෙන
තාත්ති එනවා
මගේ පුංචි යාලුවන්ගෙ
තාත්තලා දකිනා විට
තාත්ති මා ලඟ නැති දුක
ගොඩක් දැනෙනවා

♦ *යසති ශෂිප්‍රභා රණසිංහ*
*හතරලියැද්ද ප්‍රාථමික විදුහල*
*මහනුවර* Sri Lanka

## CANNING ටින්වල ඇහිරීම




High temperatures kill the micro organisms which cause food to go bad, and this method of food preservation is one of the most widespread. Canning involves putting food in the peak of condition into tins that are then sealed. The tins are then heat sterilized and cooled. In 1810, Nicolas Appart pioneered the preservation of food by heat treating food in sealed glass containers. Aluminium and steel with special coatings are now used for cans and plastic materials are increasingly being used to package heat-treated foods.

අධික උෂ්ණත්වය අහාර වර්ග නරක්වීමට හේතු වන කුඩා ජීවීන් විනාශ කරයි. මෙම ක්‍රමය ප්‍රයෝජනයට ගනිමින් ආහාර සුරැකිව කල්තබා ගැනීමේ පිළිවෙල අද ඉතා පුලුල්ව භාවිතා කෙරේ. ටින්වල ඇහිරීමේදී කරනු ලබන්නේ ආහාර පිළියෙළ කළ විගස ටින්වල බහා, ඒ සැනින් සීල් කිරීමයි. ඊළඟට එම ටින් දැඩි උෂ්ණත්වයට ලක්කොට විෂබීජ නසා නැවත නිවෙන්නට හැරීමයි. මෙම ක්‍රමය සොයා ගත්තේ වර්‍ෂ 1810 දී නිකලස් එපාට් නම් කෙනෙකි. ඔහු එදා පාවිච්චි කළේ වීදුරු භාජනයි. අද දවසේ ඇළුමිනියම් හා වානේ ආලේප කළ ටින් හා ප්ලාස්ටික් වලින් නිම කරන ලද භාජන කල් තබන ආහාර අසුරන්නට යොදා ගනිති.

♦ *Auntie Ramani* (*රමණී නැන්දා*)

## සුන්දර රාත්‍රිය

හඳපායා හඳපායා
හඳමාමා හිනැහෙනවා
තරුපායා තරු පායා
තරු නැන්දා හිනැහෙනවා
සුළං හමා සුළං හමා
සීතල ඇඟ දැවටෙනවා
මල් පිපිලා මල් පිපිලා
සුවඳ දසත පැතිරෙනවා

♦ *ලහිරු නවීන්ද්‍ර*
*ජයසූරිය*
*ඕල්කොට් කනිටුවිදුහල*
*වේරගම්පිට මාතර*
Sri Lanka


නව ඇරඹුමක්

BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka

BANK OF CEYLON (UK) Ltd.
ඔබගේ සියලුම බැංකුකරණ කටයුතු සඳහා
දැන් විවෘතයි...!

- ඉතිරිකිරීමේ ගිණුම්, ජංගම ගිණුම්, ස්ථාවර තැන්පතු
- පුද්ගලික ව්‍යාපාරික ණය
- ආනයන හා අපනයන සේවාවන්
- විදේශ මුදල් (යූරෝ හා ඇමරිකානු ඩොලර්) හුවමාරුව

ලංකා බැංකුවේ ශාඛාවක් ලෙස ක්‍රියාත්මක වූ අප දැන් එක්සත් රාජධානියේ, ස්වාධීන බැංකුවක් ලෙස ස්ථාපනය කර ඇති බව සතුටින් දැනුම්දෙමු.


අප මගින් ශ්‍රී ලංකාවට මුදල් යවන ඔබ සැමට ලංකාවට ගොස් නැවත පැමිණීමට ගුවන් ටිකට් පතක් දිනාගැනීමේ අවස්ථාවක්...!
2012 ජූලි තෙක් සෑම මසකටම වරක්...!
මුදල් යවන වාර ගනන වැඩිවන තරමට දිනන අවස්ථාද වැඩිවේ..!

BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka

1 Devonshire Square, London EC2M 4WD,
Tel: 020 7377 1888 Fax: 020 7377 5430
Email : info@bankofceylon.co.uk Web : www.bankofceylon.co.uk
Nearest Tube: Liverpool Street

(Bank of Ceylon(UK)Ltd is 100% owned by Bank of Ceylon, Sri Lanka)
Bank of Ceylon (UK) Limited is authorised and regulated by the Financial Services Authority
(FSA Referance No: 514744)
Registered in England and Wales(Company Registration No:06736473).
Registered address and Head Office: 1 Devonshire Square,London EC2M 4WD




## පද්මා කුරුප්පු ලියූ අලුත්ම නවකතාව

**ප්‍රකාශනය – සරසවි – නුගේගොඩ**


ප්‍රකට ලේඛිකාවක්, කවිදියක් සහ නවකතාකාරියක් ලෙස සිංහළ පාඨක ලෝකය මැනවින් හඳුනන ප්‍රංශයේ පැරිස් නුවර වෙසෙන පද්මා කුරුප්පු ගේ සිව්–වැනි නවකතාව වන **දූවිලි** මේ නොබෝදා මුද්‍රණයෙන් නිකුත්වීය. මින්පෙර ප්‍රකාශයට පත් ඇයගේ මද්දුමී, චූලබන්ධන සහ සත්‍යාංගනා නම් නවකතා තුනසේම මෙම අළුත් කතාවද ලාංකික සමාජයේ පවුල් සංස්ථාවේ සංකීර්ණ බව විග්‍රහ කරමින් ලියැවුණකි. දූවිලි කතාවේ ඇති විශේෂය නම් මව්පිය–දරු සබඳතාවන්, දෛනික ජීවිතයේ ගැටීම්, හැපීම්, වේදනා මෙන්ම සැප විහරණ ආදිය හමුවේද නොවෙනස්ව ගලායන බව විචිත්‍රව දැක්වීමයි.

කතාවේ පසුබිම ආරම්භ වන්නේ ගමේ පැරණි වළව් පෙලැන්තියෙනි. එතැනින් එය වර්තමාන සාමාන්‍ය මධ්‍යම පන්තික පවුලක් දක්වා විකාශනය වෙයි. ඒ පරම්පරාවල දරුවෝ අධ්‍යාපනයෙන් විවිධ ක්ෂෙත්‍රයන් තුළ විහිද යති. එහෙත් එයින් එක් දරුවෙකුට උත්පත්තියෙහිදී තම පවුල් පසුබිමෙහි වූ කිසියම් අඩුපාඩුකමක් ඉදිරියට විත් එය ජීවිතයට විශාල කරදරයක් වන්නට පටන් ගනී. දූවිලි කතාව ගොඩ නැගී ඇත්තේ ඒ කාරණය මතය.

කතුවරිය මෙහිදී අවධාරණය කරන්නට මහන්සි ගන්නා වැදගත්ම දෙය නම් කිසියම් දරුවෙකුට තමන් අරන් හදාගත් බව පසුකාලයකදී වැටහුණු විට ඒ



ඒ දරුවා තුළ ගැහැණු හෝ පිරිමි වුවද වෙනසක් නැතිව හටගන්නා මානසික පීඩනයයි. තමාගේ මව හෝ පියා කවුරුන් විය හැකිද යන ප්‍රශ්නය නිරන්තරයෙන් ඔවුන් සිතට ඇතුළුව පසුව ක්‍රමයෙන් එය මහා වධයක් බවට පත්වෙයි. අනතුරුව ඒ පුද්ගලයාට තම අනන්‍යතාව සොයාගන්නට විශාල අශාවක් ඇතිවෙයි. එයම ජීවිතය නීරස




කරන මහා අසහනයක් සේම අභියෝගයක් බවද හඳුනාගනී. අවසන එය කෙසේ හෝ ජය ගන්නට අරගලයක යෙදෙයි. සැබැවින්ම ජයගනී.

**දූවිලි** නවකතාවේ මුඛ්‍යාර්ථය එයයි. එම සිද්ධීන් විස්තර කරන්නට අවශ්‍ය පවුල් වට පිටාවද පද්මා මනාව ගොඩ නගාගෙන තිබේ. එය වර්තමාන ලංකාවේ දේශපාලන ක්‍රියාදාමයන්ටද සමීපකරවා ඇත. එයට උචිත බස්වහරක්ද උපයෝගීකරගෙන ඇත.

**දූවිලි** නවකතාව කියවා ගෙන යාමේ දී අඩුපාඩුවක් වශයෙන් මට හැඟුනේ කතුවරිය සිය කතාව කීම පිණිස කතාව තුළ චරිත රාශියක් පෙළගස්වා තිබීමයි. චරිත කීපයක් තුළින් පමණක් කතාව විකාශනය වන්නට හැරියානම් යයි අවසන මට හැඟිණ. එහෙත් එය දෝශයක් වශයෙන් දක්වන්නට මම මැළිවෙමි. එය පද්මාගේ කතාකීමේ කලාව විය හැකි ය.

දූවිලි නවකතාව කියවද්දී මගේ සිත නිතැතින්ම ගියේ 60 සහ 70 දශකයන්හි ඇතිවූ යොවුන් නවකතා කලාව වෙතය. ඒ යුගයේ බටහිර ප්‍රචලිතව තිබූ "ඩෙනිස් රොබින්ස් රොමැන්ස් " ( Denis Robins romance) ආරට යමින් කරුණාසේන ජයලත්, කුමාර කරුණාරත්න, එඩ්වර්ඩ් මල්ලවාරච්චි, කරුණාරත්න සපුතන්ත්‍රී, උපාලි වනිගසූරිය වැනි ලේඛකයින් විසින් ලියන ලද යොවුන් ප්‍රේමය පසුබිම් කරගත් නවකතා ලංකා සමාජයේ යොවුන් පරපුර තුළ පොත්පත් කියවීමේ රුචිය වර්ධනය කරන ලද ආකාරයයි.

එය ආරම්භ වූයේ පාසැල් ප්‍රේමයක් පසුබිම් කරගෙන කරුණාසේන ජයලත් ලියූ 'ගොලු හදවත' නම් නවකතාවට පසුවය. ඒ යුගයේ පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් ඇරඹුණු එම යොවුන් කතා කියවීමේ උන්මාදය වැඩිහිටියන් අතරට පවා විහිදී ගියේය. එම ජනප්‍රියතාව නිසාම ජයලත් එවැනිම යොවුන් ප්‍රේමය පදනම් කරගත් පොත් පෙළක්ම ලිවූයේය. එකල ජයලත්ගේ නවකතාවක් නොකිය වූ තරුණයෙක් තරුණියක් සිංහළ ජන සමාජයේ නොසිටි තරම්ය. පසු කලෙක ලෙස්ටර් ජේම්ස් පීරිස් ගොළු හදවත චිත්‍රපටයක් ලෙස තැනීම යොවුන් නවකතා ජනප්‍රිය වන්නට තවත් රුකුලක් වූයේය.

ඉහතකී නවකතාවන් ලියැවෙන සමයේම මහාචාර්‍ය සරච්චන්ද්‍ර, ගුණදාස අමරසේකර, ආචාර්‍ය සිරි ගුණසිංහ ආදී පේරාදෙනියෙන් බිහිවූ ලේඛකයන් පිරිසකගේ නවකතා ආදිය වෙනම වර්ගයකට අයත්වූ විදග්ධ සාහිත්‍යය ලෙස ද, ජයලත්ලාගේ කතා සිල්ලර බොළඳ කතා ලෙසද, එකල කතාබහට ලක්වූ බවක්ද මට මතකය. අවංකවම කිවහොත් අප රටේ සාමාන්‍ය තරුණ පෙළට කියවීමේ රුචිය ඇති කළේ ඒ බොළඳ ප්‍රේම කතා බව අවංකවම පිළිගන්නට අපට සිදුවේ.

අද ලාංකික නවකතාව සාහිත්‍යමය වශයෙන් පමණක් නොව සාමාජීය දේශපාලනික හා මනෝවිද්‍යාත්මක වශයෙන්ද ජීවිතය දෙස බලන්නට වෑයම් කරන සැටියක් අපට පෙනී යයි. එය සිංහළ නවකතාවේ උන්නතියට හේතුවන්නකි. ඒ නිසා කිසිම නව කතාවක් බොළඳයයි බැහැර කරන්නට මම මැළිවෙමි. ඒ හැම එකකකම එක් කෙනෙකු නොදක්නා වටිනාතව කෙනෙකු දකිනු නොඅනුමානය. පද්මා කුරුප්පුගේ **දූවිලි** නවකතාව අප පාඨක සමූහයා අතර ජනප්‍රිය වන බවට සැකයක් නැත.

♦ **වෙනුර**

**Srilanka Information Sites ශ්‍රී ලංකා තොරතුරු අඩවි**
www.srilankans.com www.srilankatours.co.uk www.srilanka-holidays.co.uk